**ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2018 ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 2,002,772,608 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 1,525,269,826 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ආදායම් ශේෂයෙහි රු. 477,502,782 ක වෙනසක් නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතු අතර, පසුව වැරදි නිවැරදි කිරීම ජර්නල් සටහන් මගින් සිදුකළ යුතු වීම. | අතපසුවීමකින් 2017 දෙසැම්බර් 31 දිනට මෙම හිඟය වාර්තා කිරීමට නොහැකි විය. එබැවින් එය 2018 ජනවාරි 01 දිනට ශේෂය ලෙස නිවැරදි කිරීමක් වශයෙන් 2018 වර්ෂයේ වාර්තාව සමඟ ඉදිරිපත් කරන ලදී. මෙම හිඟ වටිනාකම වූ රු. 477,502,782 ක් මේ වන විටත් හිඟව පවතී. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳ නිකුත් කරන ලද වාර්තාව හා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තාව අතර රු. මිලියන 41,888 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතු සොයා වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවීම. | ඉදිරියේ දී මෙම වෙනස්කම් ගැන සොයා බලා භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම් කර නිවැරදි කිරීම් සිදු කිරීමට අදාළ අංශවලට උපදෙස් ලබාදෙන බව. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ.**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දැනට සේවයේ නොමැති නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති ණය ශේෂය රු.මිලියන 103.27 ක් විය. ඉන් වර්ෂ 05 ක් ඉක්ම වූ ණය ශේෂය රු.මිලියන 44.44 ක් වූ අතර, වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර අය විය යුතු ප්‍රමාණය රු.මිලියන 15.94 ක් විය. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මියගිය නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් ගොනු සැකසෙමින් පවතින නිසා එම ගොනු අවසන් වූ පසු එම ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනිමට කටයුතු කරන බව. |
| (ආ) | දේපළ ණය ලබාගෙන ඇති සේවයේ නොමැති නිලධාරීන් 91 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ පරාසයක අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 4.911 ක් හා වර්ෂ | දේපළ ණය සඳහා ලබාගෙන ඇති ඇපය හෝ ඇර්ටෝනි බලය පාවිච්චි කර හිඟ | අයකර ගැනීමට නොහැකි ප්‍රමාණයක් ඇතොත් ඇපකරුගෙන් හෝ ඇටෝර්නි බලය භාවිතා කර හිඟ ණය ශේෂ |

| | | |
|---|---|---|
| 05 ට වැඩි ණය ශේෂය රු.මිලියන 4.17 ක්ද විය. | ණය අයකර ගැනීමට නීතිමය වශයෙන් කටයුතු කළ යුතුවීම. | අයකර ගැනීමට කටයුතු කෙරේ. අනිකුත් දේපල ණය සඳහා ඇටෝර්නි බලය භාවිතා කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන ලෙස අදාල උපදෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වා ඇත. |

**1.6.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 102 - 109 | ❖ 2014 අප්‍රේල් 30 දින S 11 – 902 දරන බලවේග එන්ජිම වෙනත් දුම්රියක ගැටීම නිසා සිදු වූ අනතුරෙන් වූ රු.මිලියන 48 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම දුම්රිය එන්ජිම | අදාළ වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූල කටයුතු කළ යුතුවීම | අදාල වාර්තා කඩිනමින් ලබාගෙන අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ අංශවලට උපදෙස් දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | අපහරණය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.<br><br>❖ රු.මිලියන 162 ක පිරිවැයකට මිලදී ගෙන තිබූ M 9 – 868 දරන එන්ජිම 2009 අප්‍රේල් 29 දින ගිනිගෙන හානියට පත් වී ඇතත් හානිය සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| **(ii)** | මුදල් රෙගුලාසි 772 | 2018 සැප්තැම්බර් 20 දින වන විට නානුඔය ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලයට අයත් භාවිතයට නුසුදුසු රේල්පීලි 1,145 ක් තිබුණු අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | -එම- |
| **(ආ)** | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 අප්‍රේල් 25 දිනැති PED/RED/07/FR/GEN දරන ලිපිය | රජය සතු වත්කමක් මගින් උපයන ආදායම රාජ්‍ය ආදායමට බැර විය යුතු වුවත් ඊට පටහැනිව මවුන්ට්මේරි ක්‍රීඩාංගනය හා සමාජ ආයතනය කුලියට දීම මගින් 2012 සිට 2017 දක්වා අයකර ගත් රු. 10,308,233 ක මුදල රාජ්‍ය ආදායමට බැර නොකර විවිධ උත්සව වෙනුවෙන් දරා තිබුණි. | රජය සතු වත්කම් වලින් උපයන ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා කටයුතු කළ යුතුවීම. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමණාකරනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 32 කින් රු. මිලියන 79.13 ක මුදලක් අයවිය යුතු අතර ඉන් සියයට 25 ක් වසර 18 කට වැඩි වූ අතර සියයට 03 ක් වසර 04 කට වැඩි ශේෂයන් විය. | මේ වන විට හිඟ ණය ශේෂය වන රු.මිලියන 40.73 ක් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අයකර ගත නොහැකි ණය ශේෂ සම්බන්ධයෙන් භාණ්ඩාගාර එකඟත්වය මත කටයුතු කළ යුතුවීම. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල වන රු. 79,138,305 ක මුදලින් රු. 17,525,671 ක් 2019 වර්ෂයේ දී අයකර ගෙන ඇත. |
| (ආ) | සියැම්සිටි සිමෙන්ට් (ලංකා) සමාගමට ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. 26,664,988 ක් අයවීමට තිබුණි. 2015 හා ඊට පෙර වර්ෂයන්ට අදාළව රු. 12,757,500 ක් හිඟව පැවති අතර 2019 වර්ෂයේ දී ඉන් රු. 11,168,472 ක් නිරවුල් කර තිබුණි. | තවදුරටත් අයවීමට ඇති මුදල නොගෙවීමට හේතු සොයා බලා එම මුදල අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනට සියැම්සිටි ලංකා සමාගමෙන් අයවිය යුතුව තිබූ රු. 26,664,988 ක මුදලින් රු. 23,216,303 ක් 2019 අප්‍රේල් වන විට නිරවුල් කර ඇති බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු. 1,190,239,418 ක් විය. එම අයවිය යුතු මුදලින් සියයට 38 ක්ම වර්ෂ 05 ඉක්ම වූ හිඟ ණය ශේෂ වන අතර එම හිඟ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් අපොහොසත් වී තිබුණු අතර එම ශේෂය තුල | හිඟ බලපත්‍ර ආදායම අයකර ගැනීමට ඇති රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කර කඩිනමින් පැරණි හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, 1985 ට පෙර සිට පැවත එන හිඟය සනාථ කිරීමට අදාළ ශේෂ ලැයිස්තුවක් | නිලධාරීන් සේවය කරනු ලබන දෙපාර්තමේන්තුවෙන් අදාළ බිල්පත් නොගෙවීම මත ණය පහසුකම යටතේ ලබා දෙන බලපත්‍ර බිල්පත් පහසුකම අත්හිටුවීම මේ දක්වා කිසිදු අවස්ථාවක සිදුකර නොමැත. රු. 769,194 ක හිඟ මුදල අයවිය යුත්තේ කුමන ආයතනවලින්ද යන්න |

| | | |
|---|---|---|
| වසර 20 කට වඩා පැරණි රු. 769,194 ක ශේෂයක්ද විය. හිඟ ආදායම සම්බන්ධයෙන් කේවල ශේෂ වර්ගීකරණයක්ද පිළියෙල කර නොතිබුණි. | නොපවතින බවට හේතු, භාණ්ඩාගාරය වෙත සාධාරණීයකරණය කර විසඳුමක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | තහවුරු කර ගත නොහැකි බැවින් එම ශේෂය පොත්වලින් කපා හැරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා සිටියද ඒ සඳහා ශේෂ ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | --------------------------- |
| (අ) | මුල් ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු නමුත් වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් රු. මිලියන 05 ක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණද, එම කාර්යය ඉටුකිරීම සඳහා ගොඩනැඟිලි අංශයේ සේවකයින් නොමැති බවට හේතු දක්වමින් මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | ප්‍රතිපාදන මාරු කිරීමට පෙර අදාළ කාර්යය ඉටුකර ගැනීමට අවශ්‍ය අනෙකුත් සම්පත් පවතිද යන්න පිළිබඳ විමසිලිමත් විය යුතු වීම. | අදාළ කාර්යය ඉටු කර ගැනීමට ගොඩනැගිලි අංශයේ සේවකයින් නොමැති වූ අතර බාහිර පාර්ශවයන්ට පවරා, එම කටයුතු ඉටු කර ගැනීමට නොහැකිවීමෙන් එසේ ඉතිරිවීම් සිදු වී ඇති බව. |
| (ආ) | වැය විෂයයන් 02 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් එකතුව රු. මිලියන 850 ක් වෙන්කරගෙන තිබුණ ද එයින් සියයට 50 කට වැඩියෙන් ඉතිරි වී තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගන්නා අතිරේක ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතු වීම. | වියදම් ගිණුම්ගත කිරීමේ අපේක්ෂාවෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගත්ත ද වර්ෂය අවසාන වීමට පෙර වියදම් සහතික පත්‍ර නොලැබීම නිසා වියදම් ගිණුම්ගත කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ආ) ඡේදයෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ බැරකම් අයිතම් 04 ක් සම්බන්ධයෙන් වාර්ෂික අයවැය සීමාව ඉක්මවා රු.මිලියන 707.25 ක බැඳීම් හා බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතු වීම. | විවිධාකාර අමතර කොටස් වර්ග විශාල ප්‍රමාණයකින් මිළදී ගැනීමට සිදුවීම හා ගබඩා අත්තිකාරම් ගිණුම මගින් මිළදී ගැනීම් සිදුකර එම ප්‍රසම්පාදනයන්ට අදාළ යෝග්‍යතා වාර්තා ලැබී ඒවා නිරවුල් කිරීමට යම් කාලයක් ගතවීම වැනි හේතු නිසා බැරකම් හා බැඳීම් වැඩිවීමට හේතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායී හා නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් සැපයීම ප්‍රධාන මෙහෙවර වුවද සමාලෝචිත වර්ෂයේ මගී දුම්රිය ප්‍රමාදවීම් 69,044 ක්ද, භාණ්ඩ දුම්රිය ප්‍රමාදවීම් 5,810 ක්ද සිදු වී තිබුණි. | දෙපාර්තමේන්තු වේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුවීම. | එන්ජින් නොමැතිවීම, එන්ජින්වල දෝෂ, ප්‍රමාණවත් භාණ්ඩ තොග නොමැතිවීම, කාලගුණික හා දේශගුණික තත්ත්වයන් ආදී දුම්රිය දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි හේතු මත සැලැසුම් කළ දුම්රියන් ධාවනයට එක් කිරීමට නොහැකි වී ඇති බව. |

**3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාර්ග ආරක්ෂණ පද්ධති 200 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2017 ජනවාරි 27 දින වන විට මාර්ග ආරක්ෂණ පද්ධති 200 ක් නිමකර භාරදිය යුතුව තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර ඇති මාර්ග ආරක්ෂණ පද්ධති ගණන 85 ක් විය. | කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීමට හේතු පරීක්ෂා කර කඩිනමින් එම කාර්යය නිම කර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මත කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කර ඇති බව. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**-----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 14,000 ක භූමි ප්‍රමාණයෙන් අක්කර 7,000 ක් පමණ බාහිර පාර්ශවයන්ට බදු දී තිබෙන අතර, එම බදුදීම සම්බන්ධයෙන් නඩත්තු වන ලිපිගොනු 7,245 කින් 1,965 ක් පමණ අක්‍රීය තත්වයේ පවතින බව නිරීක්ෂණය විය. ලිපිගොනු පරිගණකගත කොට යාවත්කාලීන කිරීම වෙනුවෙන් රු. 900,000 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය යාවත්කාලීනව සිදු වී නොතිබුණි. | සේවා ලබා ගැනීමට අදාළව එකඟ වූ ගිවිසුමේ සඳහන් අයුරින් ක්‍රියාකළ යුතු වීම. | ICTA ආයතනය සමඟ සිදුකළ කාර්යයක් බැවින් ඔවුන් විසින් තෙවන පාර්ශවයක් වන බාහිර ආයතනයකට ගෙවීම් සිදු කරන ලෙස කළ ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ නොහැකි නිසා මෙම කාර්යය අඛණ්ඩව සිදු කළ නොහැකිව තාවකාලිකව නවතා ඇත. |

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මහනුවර සිට ගැටඹේ දුම්රිය හරස් මග දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2016 ඔක්තෝබර් 19 වන දින ඉදිකිරීම් ආරම්භ කර 2017 අප්‍රේල් 07 දින නිම කළ යුතු වුවද, 2019 මාර්තු වන විටද එහි වැඩ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති නියමිත දිනට නිම කරවා ගැනීමට පියවර ගත යුතු අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාවය හා පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් අපේක්ෂිත කාලය තුල ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට නොහැකි වූ අතර මේ වන විට එම කටයුතු සිදුවෙමින් පවතී. වර්තමානයේ ව්‍යාපෘතිය එහි අවසන් අදියරේ පවතී. |

**3.5 ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | හදිසි මිළදී ගැනීමක් වශයෙන් 2014 වර්ෂයේදී රු. මිලියන 25.56 ක වටිනාකමකින් යුත් දුම්රිය හරස් මාර්ග සඳහා උපාංග මිළදී ගෙන තිබුණ ද ඉන් රු. මිලියන 6.31 ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන මේ වන විටද සංඥා උප දෙපාර්තමේන්තුවේ ගබඩා කර තිබුණි. එම උපාංග සඳහා ලබා දී තිබූ වසර 02 ක වගකීම් කාලයද | වගකිව යුත්තන්ට එරෙහිව විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවීම. | ලබාගෙන තිබූ දුම්රිය හරස් මාර්ග ආරක්ෂිත පද්ධති සවි කිරීමට යොදා ගන්නා කබඩ් ලබා නොදීම මත භාවිතයට ගැනීම ප්‍රමාද වූ නමුත් එම කබඩ් 2018 වර්ෂයේ අගභාගයේ ලබා ගැනීමට හැකි වූ අතර මේ වන විට කබඩ් 19 සවිකර භාවිතයට යොදවා ඇත. ඒවා යහපත් ක්‍රියාකාරීත්වයේ පවතී. |

මේ වන විට ඉකුත් වී ඇත.

| | | |
|---|---|---|
| **(ආ)** සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව සඳහා 2014 වර්ෂයේ දී මිළදී ගත් රු.මිලියන 11.36 ක් වටිනා සංඥා උපකරණ සඳහා තාක්ෂණික යෝග්‍යතාවය නොතිබීම හේතුවෙන් 2015 පෙබරවාරි 15 දින එම උපකරණ ප්‍රතික්ෂේප කර තිබියදීත් තවදුරටත් ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි. | සැපයුම්කරුගෙන් අයකර ගත යුතු අතර සම්බන්ධිත පුද්ගලයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | වර්තමානයේ පවතින තත්ත්වය සලකා බලා සංඥා සුදුසු ලෙස වෙනස්කොට භාවිතයට ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර මෙම වසර තුල කඩිනමින් භාවිතයට යෙදවීමට උපදෙස් ලබා දී ඇත. එම වෙනස් කිරීම සඳහා යන වියදම සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමට අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කරන බව. |

## 3.6 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි අදාළ දිනයන්හිදී කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට ඉදිරිපත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් එපරිදි ක්‍රියාකර නොතිබුණි. | චක්‍රලේඛ වලින් දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතු අතර වාර්තා යැවීමට ප්‍රමාදවීමට හේතු සලකා බැලිය යුතු වීම. | දෙපාර්තමේන්තුව සතු වත්කම්වලින් කොටසක් දැනටමත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි වත්කම්ද ඉදිරි කාලයේ දී කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. |

**3.7** **පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර 10 කට අඩු රු.25,000 නොඉක්මවන සිද්ධි 180 කට අදාළ රු.මිලියන 1.9 ක් වූ හානි සම්බන්ධයෙන් නිසි පියවර නොගැනීම නිසා එම හානි හා පාඩු තවදුරටත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | හානි, පාඩු අවම කර ගැනීමටත් අලාභවලට සම්බන්ධ පුද්ගලයන්ගෙන් අලාභ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවීම. | මෙම අලාභහානි සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනම් කිරීම සඳහා අදාළ අංශවලට උපදෙස් ලබා දෙන බවත්, මෙම කටයුතුවලට අදාළ ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරනු ලබන බව. |
| (ආ) | පසුගිය වසර 15 ක පමණ කාලය තුල සිදු වූ පාඩු හා හානි සම්බන්ධයෙන් පත් කල පරීක්ෂණ කමිටු මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාර වාර්තා නිම නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 25,000 කට වැඩි අලාභ හානිවල වටිනාකම රු.මිලියන 253.74 ක් විය. | -එම- | මෙම පරීක්ෂණ කටයුතුවලට සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනම් කිරීම සඳහා අදාළ අංශවලට උපදෙස් ලබා දී අදාළ ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරනු ලබන බව. |
| (ඇ) | රත්මලාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා 39 සඳහා 2017 වසරේදී Single Copper Cable 240 mm මීටර් 500 ක් මිළට ගෙන තිබූ අතර, එම කේබල්වලින් රු.මිලියන 1.55 ක් වටිනා කේබල් මීටර් 215 ක් 2017 වර්ෂයේ දී සොරකම් කර තිබූ අතර මෙම හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර | සොරකම සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුවීම. | පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | තලෙයිමන්නාරම්තොට අංගනයේ තිබූ රු.මිලියන 11.69 ක වටිනාකමින් යුත් රේල්පීලි 50 ක් අස්ථානගතවීම පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | මෙම පාඩුව 2017 සැප්තැම්බර් 25 දින සිදු වූ අතර ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුත්තන් නිශ්චය කිරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් සිටින අතර එහි ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරන බව. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------- |
| (අ) | <u>සංඥා ඒකක මිලදී ගැනීම</u>.<br><br>සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව සඳහා 2014 ජූනි 30 දින සංඥා ඒකක 35 ක් රු.මිලියන 11.36 ක් වැය කර මිළදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| **(i)** | සංඥා උපකරණ දුම්රිය දෙපාර්තමේන්තුවට භාරදුන් දින සිට වසර 02 ක කාලසීමාවක් දක්වා සැපයුම්කරු වගකීමට බැඳුණද, ඒවා භාවිතයට යෝග්‍ය නොවන බව අදාළ ඉංජිනේරුවරයා විසින් දැනුම් දී තිබුණද, 2018 ඔක්තෝබර් වන විටත් අදාළ සැපයුම්කරුවන්ගෙන් තාක්ෂණිකව යෝග්‍ය භාණ්ඩ ලබා ගැනීමට හෝ අලාභය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම මිළදී ගැනීම සඳහා සම්බන්ධිත පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර සැපයුම්කරුවන්ගෙන් හානිය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. | වර්තමානයේ පවතින තත්ත්වය සළකා බලා සංඥා සුදුසු ලෙස වෙනස්කොට භාවිතයට ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර මෙම වසර තුල කඩිනමින් භාවිතයට යෙදවීමට උපදෙස් ලබා දී ඇත. එම වෙනස් කිරීම් සඳහා යන වියදම සැපයුම්කරුගෙන් ලබා ගැනීමට අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. |
| **(ii)** | සංඥා උපකරණ නිදහස් කර ගැනීමට ප්‍රමාද වී තිබීම හේතුවෙන් බැංකු පොළී වශයෙන් රු.149,005 ක්ද, නැව් ගාස්තු හා අනෙකුත් වියදම් ලෙස රු. 676,943 ක්ද වශයෙන් එකතුව රු. 825,948 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| **(ආ)** | 2014 වර්ෂයේදී සංඥා උප දෙපාර්මේන්තුවට මිළදී ගෙන තිබූ රු.මිලියන 7.67 ක් වටිනා Barrier Machine (24v DC) 09 ක වගකීම් කාලසීමාව අවසන් වී තිබූ අතර ඒවා භාවිතයට ගෙන නොතිබුණි. තවද එම භාණ්ඩවල නිදහස් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ගෙවීමට සිදු වූ රු. 170,605 ක අතිරේක බැංකු පොළිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකීම් කාලසීමාව අවසන් වන තෙක් ගබඩා කර තිබීමෙන් ඒවා භාවිතයට ගැනීමේ දී ඇතිවන දෝෂ සහගත තත්ත්වයන් නිසා ඇතිවන පාඩු සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් වගකිව යුතුවීම සහ ප්‍රමාදය හේතුවෙන් ගෙවීමට සිදු වූ අතිරේක බැංකු පොළිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් | (24v DC) Machine 09 ක් පමණ දැනට ගබඩාවේ ඇති අතර ඉන් 05 ක් Ericson වර්ගයටත් 04 ක් Nima වර්ගයටත් අයත් වේ. මේවා හදිසි නඩත්තු කටයුතු සඳහා වෙන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | අයකර ගත යුතුවීම. | |
| (ඈ) | රත්මලාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවේ නිල නිවාස පරිශ්‍රය සඳහා ජල මීටර් සවි කිරීමට ප්‍රමාදවීම මත 2018 වර්ෂයේ මුල් මාස 09 දී පමණක් ජල පරිභෝජන ඒකක 325,500 ක් වෙනුවෙන් රු.මිලියන 23.08 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. | රත්මලාන උප දෙපාර්තමේන්තුවේ ඉහළ වටිනාකමකින් යුත් ජල බිල් ගෙවා තිබුණද, රත්මලාන නිල නිවාසවාසීන් බිල්පත් නොගෙවීම හා අනවසර පදිංචිකරුවන් ජලය ලබාගන්නා බැවින්, මෙම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා කඩිනමින් පියවර ගත යුතුය. | මෙතෙක් ජල මීටර් සවිකර නොමැති නිවාස සම්බන්ධයෙන් ගාස්තු අයකර ගැනීමේ ගැටළුව පැන නැගී ඇති අතර, ඉතිරි නිවාස සඳහාද කොටස් වශයෙන් ජලමීටර් සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින්, මෙම ගැටළුව ඉදිරියේ දී නිරාකරණය කර ගැනීමට හැකිවන බව. |
| (ඈ) | රත්නපුර දුම්රිය නියාමක බංගලාව නීත්‍යානුකූල බදු ගිවිසුමකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු විසින් භාවිතා කර ඇති අතර ඔවුන් විසින් 1996 සිට 2015 මැයි 31 දක්වා ගෙවිය යුතු හිඟ බදු මුදල වන රු.මිලියන 2.53 ක් හා 2016 ජූනි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු හිඟ මුදල රු.මිලියන 0.88 ක් වශයෙන් එකතුව රු.මිලියන 3.41 ක මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම සිද්ධියට අදාළව කඩිනමින් පිළිතුරු සපයන ලෙස අදාළ අංශවලට දන්වා ඇතිබව. |
| (ඉ) | නානුඔය දුම්රිය ස්ථානයේ රු.මිලියන 1.8 ක් වැයකර ඉදිකරන ලද විවේකාගාරය 2017 ඔක්තෝබර් වන විට ඉදිකිරීම් නිම වී තිබුණ ද 2018 ජූලි දක්වා විවෘත කිරීමට කටයුතු නොකර වසරක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි. 2018 අගෝස්තු මාසයේදී තක්සේරු කිරීමකින් තොරව හා අරමුණින් බැහැරව මාසික කුලිය රු. 155,000 කට බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි. | ගොඩනැඟිල්ල තක්සේරු කර නැවත ටෙන්ඩර් කැඳවීම් හෝ බදුදීම හෝ දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවත්වා ගැනීම සිදුකළ යුතුවීම. | විවෘත මිල ගණන් කැඳවීම නිසා රජයේ තක්සේරුවක් ලබාගෙන නොමැති බව. |

(ඊ) කොළඹ කොටුව සිට රත්මලාන දක්වා වූ දෙපාර්තමේන්තුව සතු ඉඩම් 2009ජනවාරි මස සිට බදු ගිවිසුම් අළුත් කිරීමකින් තොරව පරිහරණය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | අංක බී/1987 දරන ගිවිසුම මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 14.78 ක ඉඩම පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට කඩ සාප්පුවක් සඳහා බදු දී තිබුණු අතර ස්ථානීය පරීක්ෂාවේදී වෙනත් අයකු වෙළඳසැල පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල වූ රු. 2,548,813 මේ වන විටත් අය වී නොතිබුණු අතර 2018 වර්ෂය සඳහා බදු මුදල් ගණනය කර නොතිබුණි. | ඉඩම් බදුදීමෙන් ලැබිය යුතු ආදායම් සෘජුවම දුම්රිය දෙපාර්තමේන්තුව ට තැන්පත් කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට හෝ එකී ඉඩම් ආපසු පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉතිරි මුදල් ගෙවන ලෙස දන්වා ඇතත් මෙතෙක් ගෙවීම් කර නොමැති හෙයින් හිඟ බදු මුදල් අයකර ගැනීමට හා රක්ෂිත පවරා ගැනීමට අදාළ “අ” නිවේදනය යැවීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. මෙම වගකිවයුත්තන්ට අදාළ ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඒ සම්බන්ධයෙන් වන ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරන බව. |
| (ii) | අක්කර 18 රූඩ් 01 පර්චස් 88 ක් වන දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක් අංක 652 දරන බදු ගිවිසුම මගින් 1964 වර්ෂයේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත බදු දී තිබුණ ද, 1978 වර්ෂයෙන් පසු බදු මුදල් නොගෙවා නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ප්‍රමාණය රු.මිලියන 14.03 ක් වී තිබුණු අතර, 2018 වර්ෂය සඳහා බදු ගණනය කර නොතිබුණි. අදාළ කාලසීමාව තුළදී බදු ගිවිසුම අළුත් නොකිරීම හා බදු පරිශ්‍රය ආපසු පවරා ගන්නා බව බදුකරුට දැනුම් නොදීම නිසා අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට ද නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ නිවැරදි දත්ත පද්ධතියක් ස්ථාපිත කරගත යුතු වීම හා යාවත්කාලීන කළ යුතු වීම. | තොරතුරු සොයා ගැනීමේ අපහසුතාවය මත අදාළ බදු ගිවිසුම අළුත් කිරීමට හෝ බදු පරිශ්‍රය පවරා ගැනීමට කටයුතු කර නැත. කෙසේ නමුත් අදාළ ඉඩම හඳුනාගැනීමට පිඹුරුපතක් සොයා ගෙන ඇති බව. |
| (iii) | 1978 පෙබරවාරි මාසයේ දී සිනමා කටයුතු සඳහා රූඩ් 01 පර්චස් 22.83 ක් රත්මලානේ කොතලාවල පුර ප්‍රජාශාලාව LA 3345 දරන බදු ගිවිසුම මගින් | නොසැලකිලිමත් භාවය නිසා සිදු වූ වරදක් බැවින් අදාළ පාර්ශවයන් විෂයෙහි අධිභාර | කාර්ය මණ්ඩලයේ නොසැලකිළිමත්කම නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බැවින් එම ගෙවීම් නිශ්චය කර අදාළ ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| | පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණි. 2014 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු බදු මුදල රු.මිලියන 5.02 ක් අය වී නොතිබුණි. එසේ වුවද 2019 පෙබරවාරි මස වන විටද එම ප්‍රජාශාලාව ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගෙන තිබුණි. | කළ යුතුවීම. | ගැනීම වෙනුවෙන් විගණන පරීක්ෂණයක් පැවත්වීමට අවශ්‍ය කටයුතු සිදුකෙරේ. එහි ප්‍රතිඵලයන් හා ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරන බව. |
| **(iv)** | 1973 ජූලි මාසයේ දී අංක LA 29871 දරන බදු ගිවිසුම මගින් වෙළඳසැල් ඉදිකිරීම සඳහා දෙහිවල - ගල්කිස්ස නගර සභාවට ලබා දී තිබුණි. කෙසේ වුවද 1997 ජූලි මාසයෙන් පසුව දුම්රිය දෙපාර්තමේන්තුව හා දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව අතර කිසිදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 8.16 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2018 වර්ෂය සඳහා බදු ගණනයද සිදුකර නොතිබුණි. | වර්තමානයට ගැලපෙන පරිදි තක්සේරු වාර්තා ලබාගෙන හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | LA 29871 දරන බදු ගිවිසුම අනුව බදු ලබා දී ඇති පරිශ්‍ර සඳහා හිඟ මුදල් ගණනය කර ඇත්තේ 2004 වසරේ තක්සේරු වාර්තා පදනම් කරගෙනය. 2018 වර්ෂයේ සිට නව තක්සේරු වාර්තා ලබාගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අදාළ අංශවලට උපදෙස් ලබා දී ඇත. මේ සම්බන්ධව ප්‍රතිඵලයන් හා ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කරන බව. |
| (උ) | 2016 මැයි 02 දින සිට 2021 මැයි 01 දක්වා වෙස්රෝයි දුම්රිය ධාවනය පෞද්ගලික සමාගමකට බදු දී තිබූ අතර එළඹ තිබුණු ගිවිසුමට අනුව අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් කොන්දේසි ඇතුළත් කර නොතිබුණෙන් අළුත්වැඩියාව සඳහා දැරූ රු.මිලියන 6.1 ක මුදල දෙපාර්මේන්තුවට වැය බරක් වී තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමේ දී නීතිපති විමසා ගිවිසුම් සකස් කිරීමට පියවර ගත යුතුවීම. | අදාළ ආයතනයන් විසින් කළ යුතු අළුත්වැඩියාවන් වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වටිනාකම රු. 9,788,540 කි. එම මුදල භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත කාර්තුවකට ලක්ෂ 05 වාරික මගින් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. 2019 පළමු කාර්තුවෙන් පසු තවදුරටත් අයවිය යුතුව ඇති ශේෂය රු.මිලියන 6.788 කි. |
| (ඌ) | යෝග්‍යතා සහතික ලබා නොදුන් හා නිකුත් නොකළ විදේශ ඇණවුම් මගින් මිළදී ගත් වටිනාකම රු.මිලියන 49.23 ක භාණ්ඩ ගබඩා වල පවතින නමුත් එම භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන | ආනයනික භාණ්ඩ සඳහා යෝග්‍යතා සහතික ලබාදීමට කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. | අදාළ ලිපිගොනු සම්බන්ධ තොරතුරු නොමැතිවීම නිසා පිළිතුරු සැපයීමේ ගැටළුවක් පවතී. රජයේ විගණන අංශයෙන් එම තොරතුරු ලබාගෙන කඩිනමින් පිළිතුරු සැපයිය |

| | | |
|---|---|---|
| නොතිබුණි. | | යුතු බවට අදාළ අංශවලට උපදෙස් දී ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම.**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු කරා ළඟාවීම සඳහා අවශ්‍ය ඉලක්ක හඳුනා ගැනීම සඳහා නිවැරදි දත්ත පද්ධතියක් සකස් කර ගැනීමට පියවර ගත යුතු වීම. | දත්ත පදනමක් සකස් කර ඉදිරියට පවත්වාගෙන යෑමට කටයුතු කරමි. එහි ප්‍රගතිය කාලානුරූපීව වාර්තා කිරීමට කටයුතු කරන බව. |

## 5. යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 52 ක් වන අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 16 ක් පමණක් වී තිබුණි. | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවූවද අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කර ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල දත්ත අනුව 2018 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 48 ක් විය. | දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ පුරප්පාඩු විශාල වශයෙන් පැවතීම කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන බැවින් පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතු වීම. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු බොහෝමයක් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් වන අතර එම තනතුරුවල III ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු පුරවා ඇති අතර I හා II ශ්‍රේණිවලට අදාළ තනතුරුවල පුරප්පාඩු පවතින අතර මේ වන විට එම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), ගමනාගමන | ආවරණ පදනමින් බඳවාගෙන ඇති | මෙම තනතුරුවලට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | අධිකාරී හා සහකාර ගබඩා අධිකාරී ආදී තනතුරු 10 ක වැඩ ආවරණය කිරීමට නිලධාරීන් 48 දෙනෙකු බඳවාගෙන තිබුණි. | තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම් කඩිනම් කළ යුතු වීම. | නොමැති වීම නිසා එම තනතුරු ආවරණය සඳහා පත් කර තිබුණි. |
| (ඇ) | අනුමත නොවු තනතුරු 1,204 ක් සඳහා අනියම් කාර්ය මණ්ඩලය ලෙස විධිමත් අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව බඳවා ගැනීම් සිදු නොකළ යුතු වීම. | මෙම ආදේශක / අනියම් සේවකයින් ස්ථිරව බඳවා ගැනීමට බඳවා ගැනීම් පටිපාටිය අනුව මේ වන විට කටයුතු කරමින් පවතින බව. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ෂන්ටින් රියදුරු, එන්ජින් රියදුරු, රියදුරු සහායක, දුම්රිය නියාමක, දුම්රිය ස්ථානාධිපති හා දුම්රිය අධීක්ෂණ කළමනාකරණ යන සේවාවන්ගේ පුරප්පාඩු සඳහා ස්ථිර බඳවා ගැනීම් කිරීමට කටයුතු නොකර සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 405 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | පවත්නා ගැටළුකාරී තත්ත්වයන් කඩිනමින් විසඳාගෙන නව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | දුම්රිය රියදුරු සහායක, ෂන්ටින් රියදුරු වැනි තනතුරුවලට බඳවා ගැනීම් සිදු කිරීමේ දී දුම්රිය රියදුරු සංගම්වල විරෝධතා, වෘත්තීය සුදුසුකම් සංශෝධනය කිරීමට කටයුතු කිරීමට සිදුවීම යනාදී විවිධ ගැටළුකාරී තත්ත්වයන් මත බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇති බැවින් සේවය අඩාල නොවී පවත්වාගෙන යාම සඳහා විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යොදවා ඇති බව. |
| (ඉ) | තෘතීය මට්ටමට අයත් තනතුරු 431 න් 189 ක්ද, ද්විතීය මට්ටමට අයත් තනතුරු 10,958 න් 1,940 ක්ද, ප්‍රාථමික මට්ටමට අයත් අනුමත තනතුරු 8,601 න් 2,973 ක්ද වශයෙන් පුරප්පාඩුව පැවතුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව වූ 5,421 න් 5,102 ක් දුම්රිය ධාවනයට සෘජුවම බලපාන තනතුරුවලට අදාළ වූ බැවින් එය ප්‍රතිශතයක් ලෙස සියයට 94 ක් විය. | දුම්රිය සේවය කාර්යක්ෂම කිරීම සඳහා මෙම අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට වගබලා ගත යුතු වීම. | සේවක අවශ්‍යතාවය සඳහන් කර කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කළත් යහපත් ප්‍රතිචාරයක් ලබා දී නොමැති බව. |